කවරෙකු ඉස්ලාමය වැළඳගෙන, ප්රමාණවත් ලෙස පෝෂණය ලබා, අල්ලාහ් ඔහුට පිරිනමා ඇති දෑ ගැන සෑහීමට පත් කරන්නේ ද ඔහු ජය ලැබීය

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බවට අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් ඉබ්නු ආස් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාර්තා
කරන ලදී: "කවරෙකු ඉස්ලාමය වැළඳගෙන, ප්රමාණවත් ලෙස පෝෂණය ලබා, අල්ලාහ් ඔහුට පිරිනමා ඇති දෑ ගැන සෑහීමට පත් කරන්නේ ද ඔහු ජය ලැබීය." [صحيح] [رواه مسلم]

"කවරෙකු තම පරමාධිපතිට අවනත වී, යහමග ලබා, ඉස්ලාමය වෙත ආශිර්වාද කරනු ලැබ, අඩු වැඩි වීමකින් තොරව තම අවශ්යතාවේ ප්රමාණයට අනුව හලාල් (නිත්යානුකූල) ආකාරයෙන් පෝෂණය ලබා, අල්ලාහ් ඔහුට පිරිනැමූ දෑ සම්බන්ධයෙන් ඔහු තෘප්තියට පත්වන සෑහීමට පත්වන පුද්ගලයකු බවට පත් කළේ ද සැබැවින්ම ඔහු සාර්ථක විය, ජය ලැබීය" යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිලි කළහ.

http://sunnah.global/hadeeth/si/show/5814